**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**තුන්වන වාර පරීක්ෂණය - 2021**

**10 ශ්‍රේණිය**

**ඉස්ලාම්**

**පිළිතුරු** **I හා I I කොටස**

**I - කොටස**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| 1 | 1 | 11 | 1 | 21 | 1 | 31 | 2 |
| 2 | 4 | 12 | 4 | 22 | 2 | 32 | 3 |
| 3 | 3 | 13 | 2 | 23 | 3 | 33 | 1 |
| 4 | 4 | 14 | 2 | 24 | 4 | 34 | 4 |
| 5 | 2 | 15 | 3 | 25 | 3 | 35 | 2 |
| 6 | 1 | 16 | 1 | 26 | 1 | 36 | 3 |
| 7 | 4 | 17 | 3 | 27 | 2 | 37 | 1 |
| 8 | 2 | 18 | 4 | 28 | 3 | 38 | 2 |
| 9 | 3 | 19 | 2 | 29 | 4 | 39 | 3 |
| 10 | 4 | 20 | 3 | 30 | 4 | 40 | 4 |

(ලකුණු 1 x 40 = 40)

**I I - කොටස**

01)

I. අල් මාඋල් කසීර් - අධික ජලය, කුල්ලතෙයින් ප්‍රමාණයට වඩා අධික අති පිරිසිදු ජලය.

අල් මාඋල් කලීල් - අල්ප ජලය, කුල්ලතෙයින් ප්‍රමාණයට වඩා අඩු ඉතා පිරිසුදු ජලය.

II. ජලය නොමැති වීම, ආසාධ්‍ය රෝගය, බීමට පමණක් ප්‍රමාණවත්ව ජලය තිබීම.

III. ඉබාදත් - අල්ලාහ් ට වන්දනය කිරීම. ඉමාරත් - පොළොව සශ්‍රීක කිරීම.

IV. වර්ග දෙකකි. ෆර්ල් අයින්, ෆර්ල් කිෆායා.

V. "ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීක ලහු ලහුල් මුල්කු වලහුල් හම්දු වහුව අලා කුල්ලි ෂයියින් කදීර්"
(لا إله إلا الله وحده لا شريك له له الملك وله الحمد وهو على كل شيء قدير)

VI. සූරා ලුක්මාන්, සූරා ෆුර්කාන්

VII. අල්ලාහ් වෙත දයාව දැක්වීම.
අල්ලාහ්ගේ මැවීම් කෙරෙහි දයාව දැක්වීම.

VIII. ඉවත් වීම, නැවත හැරීම

IX. හාබිල් - ගොවිතැන
කාබිල් - සත්ව පාලනය

X. නිරෝගී බව, විවේකය

(2 x 10 = 20)

02)

1. අල් කුර්ආනය, අස් සුන්නාහ් ව (ලකුණු 2 යි)
2. සහාබාවරු හදීස් නිවැරදිව කටපාඩම් කළහ. සහාබවරු අතරින් ලිවීමට දන්නා අය ඒවා ලියා ආරක්ෂා කළහ. සහාබාවරු තමා දන්නා හදීස් අන් අයට සාධක සහිතව දැනුම් දුන්හ. සහාබාවරු හදීස් ක්‍රියාත්මක කළහ. (ඕනෑම කරුණ තුනකට ලකුණු 3යි)
3. සුන්නාහ්ව උදාසීන කර අල් කුර්ආනය අවබෝධය කර ගැනීමට හෝ ක්‍රියාත්මක කිරීමට හෝ නීතිමය විසඳුම් දීමට හෝ නොහැකිය. උදාහරණ: අල් කුර්ආනය සලාත් කිරීමට පවරයි. සලාත් කරන්නේ කෙසේද, සලාත් කලයුතු කාලය, සලාත් කලයුතු ආකාරය, සලාතයේ නීතිරීති සියල්ල පැහැදිලි කරන්නේ සුන්නාහ මගින්ය.
ඉම්රාන් බින් හුසෙයින් රලියල්ලාහු අන්හු තුමාගේ සිදුවීම, නීති රීති සියල්ල සුන්නාහ් පැහැදිලි කරයි. ඉම්රාන් බින් හුසෙයින් රලියල්ලාහු අන්හු තුමාගේ සිදුවීම, උදාහරණ: අබ්දුල්ලාහ් ඉබ්නු උමර් රළියල්ලාහු අන්හු තුමා වෙත කෙනෙක් පැමිණ, ජම්උ කස්ර් පිළිබඳ අල් කුර්ආනයේ පවසා තිබේ දැයි විමසුවේය. එයට ඔවුහු අල්ලාහ් අපට නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ව දූතයෙකු ලෙස නියෝජිතයෙකු ලෙස යැව්වේය. එතුමාණන් ලෙසම අපි ද කරන්නෙමු යැයි පැවසූහ. නීති ක්ෂේත්‍රයේ විසඳුම් සඳහා ද සුන්නාහ් ව අවශ්‍ය වේ.
උදාහරණයක් ලෙස සොරකම් කළ ඔප්පු වූයේ නම් අත සිඳ දැමීම කළ යුතු බව අල් කුර්ආනයේ සඳහන් වේ. නමුත් සුන්නාහ් මගෙන් කුඩා දරුවන්ට හා මානසික රෝගීන්ට නීතිමය සහන ලබා දී ඇත.

(උදාහරණ සමඟ පැහැදිලි කර ඇත්නම් ලකුණු 5යි)

(එකතුව 2 + 3 + 5 = 10යි)

03)

1. එකමුතු කිරීම, ස්ථිරත්වය ට එළැඹීම, ඒකමතික තීරණය. (ලකුණු 2 යි)
2. සමාජය එකමුතු කම රැකෙයි, සමාජ විනය නොපිරිහීම, අනෝන්‍යා සහයෝගය, මූලික අවශ්‍යතා රැකෙයි. (ලකුණු 3යි)
3. - **අල් අස්ල්**: අල් කුර්ආනයේ හෝ අල් හදීස් හි මෙයට පෙර විසඳා ඇති ගැටලුව අල් අස්ල් නම් වේ.

   - **අල් ෆර්උ** : අල් කුර්ආනයෙන් , සුන්නාවෙන් හෝ ඉජ්මාවෙන් විසඳුම් ලබා දී නොමැති විසඳුම් ලබාගත යුතු ගැටලුව අල් ෆර්උ නම් වේ.

   - **අල් ඉල්ලත් -** ගැටලු දෙක අතර දක්නට ලැබෙන පොදු ලක්ෂණය නොහොත් පොදු ගුණාංගය ඉල්ලත් නම් වේ.

   - **අල් - හුකුම් -** අල් කුර්ආනය ට හෝ අස් සුන්නාහ්වට අනුකූල වන පරිදි ඉදිරිපත් කරන ලද තීන්දුව මේ නමින් හැඳින්වේ. (ලකුණු 5යි)

(එකතුව 2 + 3 + 5 = 10යි)

04)

1. දැනුමෙන් හා යහ ගුණාංග වලින් පිරිහුණු කාලය ජාහිලියා කාලය නම් වේ. තවදුරටත් දේව මගපෙන්වීම ට විරුද්ධව ජීවන රටාවක් පැවති කාලය වේ. (ලකුණු 2යි)
2. සටන් වලට සහභාගී වීම සඳහා පිරිමි අවශ්‍ය විය. සටන් වලදී දිරිගැන්වීම සඳහා ද, සටන් පවත්වාගෙන යාම සඳහා ද සටනට උනන්දු කරවීමට කවියන් අවශ්‍ය විය. (ලකුණු 3යි)
3. **දුර් ගුණාංග**: මිනිමැරීම, සුරාපානය, පොලිය, දුරාචාරය, පලිගැනීම, මං පැහැරීම.

   **යහ ගුණාංග**: භාෂා නිපුණතාවය, නිදහස් ක්‍රියාකාරකම්, පොරොන්දු කඩ නොකිරීම, ආගන්තුක සත්කාරය, වීරත්වය, සරල බව. (ලකුණු 5යි)

(එකතුව 2 + 3 + 5 = 10යි)

05)

1.
2. පිවිතුරු චේතනාව, මූලික වතාවත්වලට අවහිර නොවීම, ශරීආවේ සීමාව ඉක්මවා නොයෑම.

(ලකුණු 3යි)

3. දේව ගුණාංගය, කිසිවෙකුට අසාධාරණ නොවීම, නම්‍යශීලීභාවය, ආර්ථික උස් පහත් කම් විධිමත් කිරීම, සමාජ හා පෞද්ගලික යහපත දැකීම, මෙලොව හා පරලොව යහපත කෙරෙහි අවධානය යොමු කිරීම,

(මෙයින් ඕනෑම කරුණු පහක් සඳහන් කර විස්තර කර ඇත්නම් ලකුණු 5යි)

(එකතුව 2 + 3 + 5 = 10යි)

06)

1. බුද්ධිය හා සම්බන්ධ- ඉගැන්වීම, හෙද වෘත්තිය, නීතිඥ වෘත්තිය

   ශාරීරික ශ්‍රමය හා සම්බන්ධ- සුළු සේවකයින්, කාර්යාල සේවකයින්, ආරක්ෂක සේවය.

(ලකුණු 2යි)

2. පිරිසුදු චේතනාව, මූලික වතාවත්වලට අවහිර නොවීම, ෂරිආවේ සීමාව ඉක්මවා නො යාම.

(ලකුණු 3යි)

3. දේව ගුණාංගය, කිසිවකුට අසාධාරණ නොවීම, නම්‍යශීලීභාවය, ආර්ථික උස් පහත්කම් විධිමත් කිරීම, සමාජ යහපත හා පුද්ගල යහපත අතර වෙනස හඳුනා ගැනීම, ආධ්‍යාත්මික හා ලෞකික අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කිරීම.

(මෙයින් ඕනෑම කරුණු පහක් සඳහන් කර පැහැදිලි කර ඇත නම් ලකුණු 5යි)

(2 + 3 + 5 = 10යි)

07)

1. අජ්නබි වූ ස්ත්‍රී හා පුරුෂ සම්බන්ධවීමේදී රැකිය යුතු පිලිවෙත්.

- බැල්ම පහත් කර ගැනීම, අව්රතයට අයත් ප්‍රදේශ බැලීම, කාමාශාවෙන් බැලීම, අවශ්‍යතාවයක් නොමැතිව අඛණ්ඩව බැලීම ආදියෙන් වැලකීම.
- අව්රතයය වැසෙන ආකාරයේ ඇඳුම් ඇඳීම.
- ඇවිද්දීම, ඇඳුම් ඇඳීම, හැසිරීම හා කතා කිරීම වැනි සියලු අංශවලින් ඉස්ලාමීය චාරිත්‍ර පිළිපැදීම.
- පිරිමින්ගේ හැඟීම් ඇවිස්සෙන ක්‍රියාවල නොයෙදීම.
- අජ්නබි වූ ස්ත්‍රී පුරුෂ යුගලය හුද කලා වීමට ඇති අවස්ථා සීමා කිරීම.
- සමාජ යහපත හා අවශ්‍යතා වෙනුවෙන් පමණක් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම හමුවන අවස්ථා සංවිධානය කිරීම.

(ලකුණු 5යි)

2. උස්මාන් රලියල්ලාහු අන්හු තුමාගේ කාලයේ අල් කුර්ආනය ගොනු කිරීමේ සේවය.

මෙතුමාගේ කාලේ සමයේ ආමේනියා, අසර්බයිජාන් යන ප්‍රදේශවල මුස්ලිම්වරු සටන් වලට මුහුණ දී සිටියහ. මේ සමග අල් කුර්ආනය වෙනස් ආකාරයට පාරායනය කළහ. අප පාරායනය කරන පිලිවෙල නිවැරදි යැයි වාද කළහ. මෙයට අවධානය යොමු කළ හුදෙයිෆතුල් යමානි රලියල්ලාහු අන්හු තුමා කලීෆාවරයාට පැමිණිලි කළේය. වහාම පියවර ගත් කලීෆා තුමා සෙයිද් බින් සාබිත් රලියල්ලාහු අන්හු තුමාගේ නායකත්වයෙන් කුරෙයිෂිවරුන්ගෙන් යුත් කණ්ඩායමක් පත් කළේය. ඔවුහු අබූ බක්කර් රළියල්ලාහු අන්හු තුමාගේ කාලයේ මුස්හෆ් ද, කුරෙයිෂිවරුන්ගේ භාෂා රටාව ද ගෙන පිටපතක් ලියූහ. එය එක් එක් පළාත්වලට බෙදා යවා ඒ සමඟම කාරිවරුන් ද යැවන ලදී. ඒ ආකාරයට පමණක් පාරායනය කළ යුතු යැයි නියම කළ කලීෆාවරයා එයට පෙර ලියන ලද සටහන් පුළුස්සා දමන ලෙස පවසන ලදී. මෙමගින් සියලු දෙනා එකම ආකාරයට අල් කුර්ආනය පාරායනය කරන ආකාරයක් ඇතිවිය. මේ හේතුවෙන් උස්මාන් රලියල්ලාහු අන්හු "ජාමිඋල් කුර්ආන්" යන ගෞරව නාමයෙන් ආමන්ත්‍රණය කරනු ලැබීය ලැබීහ.

(ලකුණු 5යි)

3. දැඩි නජීස් හා ඒය පිරිසිදු කරන ආකාරය.

බල්ලා හා ඌරා යන සතුන්ගේ මලපහ, මූත්‍රා, දහඩිය, කෙල, රුධිරය ආදී සියල්ල දැඩි නජීස් හි අඩංගු වේ. මෙම නජීස් සිරුරෙහි හෝ ඇඳුම්වල හෝ තැවරුණ විට පළමුවෙන් එය එම ස්ථානයෙන් ඉවත් කළ යුතුය. පසුව නජීසයේ ගඳ, සුවඳ, රසය, වර්ණය යනාදිය ඉවත් වන තුරු සේදිය යුතුය. සත් වරක් සේදිය යුතුය. එයින් එක් වරක් පස් මිශ්‍ර ජලය විය යුතුය. නජීස් තැවරුණ ස්ථානයේ ගන්ධයේ, රසයේ හෝ වර්ණයේ වෙනසක් නොමැති වුවද සත් වරක් සේදිය යුතුය.

(ලකුණු 5යි)

4. අල් කුර්ආනයේ පවසන ආකාරයට සිතෙහි අවස්ථා තුන:

I. නෆ්සුල් අම්මාරා බිස් සූහ් - අයහපතට පොලඹවන සිත. යහපත කිරීමට නොසිතන සිත. ආශාවන්ට හා ෂෙයිතාන් ට යටත් වූ සිත.

II. නෆ්සුල් ලව්වාමහ්- තමා රිදවා ගන්නා සිත. හැඟීම් වලට විරුද්ධව සටන් කරන, අකුසලයෙහි නිරතවූයේ නම් ඒ ගැන සිතා පසුතැවිලි වන සිත.

III. නෆ්සුල් මුත්මයින්නා- තෘප්තිමත් සිත, කලබලයෙන් හා නොසන්සුන් බවෙන් තොර තැන්පත් බවක් දක්නට ලැබෙන මෙම සිතෙහි යහපත කෙරෙහි ඇති පෙළඹවීම අධිකව දක්නට ලැබේ.

(ලකුණු 5යි)

(මුළු ලකුණු 5 + 5 =10යි)

අවසාන ලකුණු - **I** පත්‍රය ලකුණු 40යි

**I I** පත්‍රය - පළමුවන ප්‍රශ්නයට ලකුණු 20යි

නෙකුත් ප්‍රශ්න 4 ට ලකුණු හතලිය

මුළු ලකුණු 100යි